Advanced level 2023

# මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම නිතටම මීඩියා

## මගෙන් වචනයක්..

උසස් පෙලට ඔයා මිඩීයා තෝරගන්න හේතු සැහෙන්න ඇති.ආසම සබ්ජෙක්ට් එක නිසා,ඉසෙඩ් එක වැඩි,ලේසි නිසා,යාලුවා කරන නිසා,එයා කරන නිසා,ගෙදරින් කිව්ව නිසා ඔය වගෙ හේතු ඇති.

ඒ මොන හේතුව තිබුනත් පොඩ්ඩො ඔයා විභාගෙට හොද ලකුණක් දාන්නම ඔනි.ඔයාට මොන හේතුවක් තිබ්බත් ඔයාගෙ දෙමව්පිය-න්ට තියෙන්නෙ එක හේතුවයි.ඒ මගෙ දුව මගෙ පුතා හොද තැනකට එව් කියන බලා-පොරොත්තුව විතරයි.ඒ බලාපොරොත්තුවත් හේතුවත් ඉශ්ඨ කරගෙන ඔයාගෙ හීනත් ඉශ්ඨ කරගෙන ඔයා විභාගේ ඉහලින්ම සමත් වෙන්න ඔනි.

ජයග්‍රහණය නෙමෙ සහභාගි වීම වැදගත් කියන තර්කෙට වැඩ කරන්නෙපා.සහභාගි වෙලා ෆෙල් ලකුනක් අරන් වැඩක් නැ.හැමෝම හිනාවෙයි.ඉතින් සහභාගි වෙලා ජයග්‍රහණය අරන් පෙන්නන්න.අඩුම උත්සහා කරන්න.

ඔයාට ජයෙන් ජය පොඩ්ඩො.!!



Design by Creativepixel.lk - Search us on fb/insta

හතර වැනි පාඩම

# සාම්ප්‍රදායික මාධ්‍ය හා ජනමාධ්‍ය නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය

Traditional Media Mass Media New Media and Social Media

විස්තරාත්මක කෙටිසටහන් පොත

Advanced level 2023

මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම නිතටම මීඩියා

විස්තරාත්මක කෙටිසටහන් පොත

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ලහිරු කේ. මදුශාන්
HNDIT , mass communication (UG)
076 3950730
071 0538308

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

# සාම්ප්‍රදායික මාධ්‍ය හා ජනමාධ්‍ය නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය

**සාම්ප්‍රදායික මාධ්‍ය යනු කුමක්ද?**

කාලාන්තරයක් තිස්සේ ගැමි ප්‍රජාව අතර තොරතුරු දැනුම, විවේකය, විනෝදය සඳහා භාවිත වන අවට පරිසරයෙන් සපයා ගත හැකි සම්පත් උපයෝගී කර ගෙන සිදු කරන සන්නිවේදන ක්‍රම සාම්ප්‍රදායික මාධ්‍ය වේ.

**සාම්ප්‍රදායික මාධ්‍යවල ලක්ෂණ**

- සාම්ප්‍රදායික සමාජවල ප්‍රභවය ලැබ එම සමාජවලම භාවිත වීම.
- ගැමි සමාජවල සිට අඛණ්ඩව පැවැත එයි.
- නියත කර්තෘත්වයක් නොමැත.
- තාක්ෂණික මෙවලම් භාවිත නොකරයි.
- ගැමි ජන සහභාගිත්වයෙන් සිදු කරයි.

**ප්‍රාග් ඓතිහාසික යුගයේ පැවත් සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම කොටස් දෙකකි.**

**1 ශබ්ද සංඥා**
**2 දෘශ්‍ය සංඥා**

**ශබ්ද සංඥා**

- බෙර, හඬ, සක්හඬ, නලා හඬ, හුව,

**දෘශ්‍ය සංඥා**

- දුම, කොළ අතු එල්ලීම, කොඩි, සලකුණු තැබීම

## සාම්ප්‍රදායික මාධ්‍යවල සුවිශේෂීතා

**1 සරල ව්‍යුහ**

සාමාන්‍ය ජනයාට අවබෝධ කර ගත හැකි සරල ව්‍යුහයන්ගෙන් සකස් වී තිබීම මෙයින් අදහස් කෙරේ.

**2 තේමාත්මක අන්තර්ගතය**

සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමවලදී තේමාවට ගැලැපෙන සේ අන්තර්ගතය සකස් කර ගැනීම මෙයින් අදහස් කෙරේ.

**3 නම්‍යශිලිත්වය**

අවස්ථාව හා අවශ්‍යතාවයට ගැළැපෙන ආකාරයෙන් සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම පහසුවෙන් සකස් කරගත හැකි වීම මින් අදහස් කෙරේ.

**4 සංස්කෘතික සන්දර්භය**

සංස්කෘතික සන්දර්භය යනනෙන් අදහස් කරන්නේ චාරිත්‍ර චාරිත්‍ර ඇදහිලි විශ්වාස කලා ක්‍රම හා දැනුම්-පද්ධති ඒ ඒ සංස්කෘතීන්ට අනුව භාවිතා කිරීම.

**5 අවමපිරිවැය**

සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමයන්හි දී අවට පරිසර-යෙන් ලබා ගන්නා සම්පත් බොහෝ විට උපයෝගී කර ගැනේ. ඒ අනුව අවම පිරිවැයකින් කාර්ය ඉටුකරගත හැකිය.

**6 ජනමූල පදනම.**
**7 විශ්වාස හා ගරු කිරීම.**
**8 පොදු පිළිගැනීම් හා පොදු යහපත.**
**9 පාරම්පරිකව උරුමවීම.**
**10 දේශීය සංස්කෘතික අනන්‍යතාව හා භාවිතය පහසුවීම.**

### සාම්ප්‍රදායක මාධ්‍ය විධික්‍රම

ජන කවි ,ජනකථා, ශාන්තිකර්ම හා යාතු කර්ම, ගැමිනාටක

### ජන කවි

ගැමි ජීවන රටා පදනම්ව ගැමි ජනතා ව්‍යවහාරයෙන් පැවැත එන කර්තෘත්වය හදුනාගත නොහැකි ගායනා විශේෂයකි.

ගැමිජනයාගේ **ජීවන දෘෂ්ටිය, ඇදහිලි විශ්වාස, අවශ්‍යතා, වෘත්තීය තොරතුරු, දැනුම, සාම්ප්‍රදායික ඥානය, විවේකය, විශ්‍රාන්තිය, දුක්වේදනා, සිතුම්පැතුම්** ආදිය සන්නිවේදනය කරයි.

### ජනකවි වර්ග

දරු නැළවිලි කවි, ගොයම් කවි, කමත්කවි, නෙළුම්කවි, තහංචිකවි, රබන්කවි, ටිකා සීපද, තෙතගු කවි

#### ජනකවි වල ලක්ෂණ

■ මුඛ පරම්පරාගත ව පැවැතීම.
■ සරල බස් වහරක් භාවිත කිරීම.
■ නිර්මාණකරුවා කවරෙක්දැයි හදුනාගත නොහැකිවීම.
■ ඒ ඒ ප්‍රදේශයට ආවේනික ලක්ෂණ වලින් සමන්විත වීම.
■ දීර්ඝ කාලයක් මුළුල්ලෙහි මිනිසුන් අතර ජනශ්‍රැතියක් ලෙස පැවැතීම.
■ ජනකවි නිර්මාණය සඳහා ජීවන අද්දැකීම් පාදකවීම.

#### ජනකවි වල සුවිශේෂිතා

■ අව්‍යාජත්වය
■ සරලත්වය
■ සංෂිප්තභාවය
■ සංයමය
■ ශබ්ද රටා හා පොදු ජනයාගේ සිතුම් පැතුම් වලට සමීප වචන පැවැතීම.

### ජන කතා

**යම් සිද්ධියක මුල මැද අග යන අංගත්‍රය මනාව ගලපන ලද ජනයාගේ ජීවන අරගලය අපෙක්ෂා, ආශා, දුක්ඛ-දොම්මනස්ස හා ගවේෂණ යනාදිය පිළිඹිබු කරන කතන්දර විශේෂයකි.**

#### ජනකතා වල ලක්ෂණ

■ මුඛ පරම්පරාගතව පැවැතීම.
■ ඒ ඒ සමාජවල ජන විඥානයේ ස්වභාවය නිරූපනය වීම.
■ කර්තෘ අඥාන වීම.
■ දැනුම උපදෙස් සම්පාදනය.



### නව මාධ්‍යයේ සහ සමාජ මාධ්‍යයේ අයහපත් බලපෑම්

■ මානසික අවපීඩනය කනස්සල්ල සියදිවි නසා ගැනීම වැනි මානසික හා සමාජීය කම්පන ඇති කිරීම
■ පෞද්ගලිකත්වය පිළිබඳ ගැටලු මතුවීම
■ සමාජිකයන්ගේ පෞද්ගලික දත්ත සමාජ ජාලා
■ සංවිධාන වෙතින් වෙනත් පාර්ශ්වයන් වෙත ලබාදීම
■ සයිබර් හිරිහැර
■ ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙලඹවීම
■ වැරදි තොරතුරු පළ කිරීම
■ ව්‍යාජ ගිණුම් සැකසීම

### නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය කාර්ය භාර්ය

■ තොරතුරු සම්පාදනය
■ විනොදාස්වාද සම්පාදනය
■ අධ්‍යාපනය
■ සමාජානුයෝජනය

ලහිරු කේ. මදුශාන්
LAHIRU K - MEDIA STU
search us on youtube,fb,Tiktok

## සමාජ මාධ්‍යයේ ලක්ෂණ

■ මෙමගින් අලුත් මාධ්‍ය සංකල්පයක් ගොඩනැගී ඇති අතර සමාජ මාධ්‍ය යනු එහි සුවිශේෂී ප්‍රවණතාවයකි පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් අතර සබැඳි ජාලවල සන්දේශ හුවමාරු කර ගැනීමෙන් සමාජ ජාල ගොඩනැගී තිබීම

■ පරිශීලනකයෙ ඩෙස්ක් ටොප් පරිගණක සහ ලැප්ටොප් පරිගණක ස්මාර්ට්ෆෝන් වෙබ් අඩවි තාක්ෂණය ඔස්සේ සමාජ මාධා වෙත අවතීර්ණ වෙති

■ පෞද්ගලික තොරතුරු තමන්ටම මුදාහැරීමට හැකියාව ලැබී තිබීම

■ සන්දේශයන්හි තොරතුරු මූලාශ්‍ර නිශ්චිත නොවීමෙ-න් විශ්වසනීයත්වය පිළිබඳ ගැටලු මතුවීම

■ නිශ්චිත ස්ථානයක් අවශ්‍ය නොවීම

## සමාජ මාධ්‍ය ප්‍රභේද

**Facebook**
**instagram**
**telegram**
**whatsapp**
**vimeo**
**tiktok**

## නව මාධ්‍යයේ සහ සමාජ මාධ්‍යයේ යහපත් බලපෑම්

■ පරිහරණය කරන්නාටම සංස්කරණය කළ හැකිවීම
■ග්‍රාහක රුචිය අනුව පරිහරණය කළ හැකි වීම
■ ක්ෂණික බව
■ එක් මාධ්‍යයකින් තවත් මාධ්‍යයකට යාමට හැකිවීම
■ සක්‍රිය ග්‍රාහකයන් සිටීම
■ දැනුම මැනවින් හුවමාරුකරගත හැකිවීම
■ දුරස්ථ ඉගෙනුම් ක්‍රියාවලියකට යොදා ගත හැකිවීම
■ ව්‍යාපාරික කටයුතු සාර්ථක කර ගැනීමට යොදාගත හැකිවීම
■ පුද්ගල නිර්මාණශීලිත්වය සඳහා අවස්ථාව හිමිවීම
■ ගැටළු සහ හැඟීම් ප්‍රකාශනයට හැකිවීම
■ දේශීය හා ජාත්‍යන්තර වාද විවාද සංවාද මැනවින් කළ හැකිවීම



**ජනකතා වර්ග**
උත්පත්ති කතා, සත්ත්ව කතා, දේවකතා, වෘක්ෂලතා කතා, ආශ්චර්ය කතා, හාස්‍යජනක කතා, උපහාස කතා, සුරංගනා කතා

**ශාන්තිකර්ම හා යාතුකර්ම**
ජනශ්‍රැති විද්‍යාවේ මේ පිළිබඳව සාකච්ඡා කෙරේ.

### ශාන්තිකර්ම
ගොවිතැන් කටයුතු සාර්ථක කර ගැනීම, සශ්‍රීකත්වය ප්‍රාර්ථනා කිරීම, පැපොල සරම්ප වැනි බෝවෙන රෝග වලින් සහ අපල උපද්‍රව වලින් අත්මිදීමට, විනෝදාස්වාදය සලසා ගැනීම උදෙසා සිදු කරනු ලබන යම් යම් ක්‍රියාකාරකම්ය.

**විවිධ ශාන්තිකර්ම**
කොහොඹ කංකාරිය, කඩවර කංකාරිය,
බලි ශාන්තිකර්මය

හිංදු සංස්කෘතියට අයත් ශාන්තිකර්ම
වඩිමෝඩි, තෙන්මෝඩි, කාමන්කූත්ත, තෙරුක්කූත්තු

### යාතුකර්ම
යම් කිසි අදෘශමාන වස්තු නැමැදීම. ඒවායින් පිහිටක් ලබා ගැනීම වැනි ක්‍රියාවන්ය. ප්‍රජාවිධි හෙවත් ශුද්ධ වූ නිමිත්තක් පදනම් වේ.

**විවිධ යාතු කර්ම**
කතරගම දේව පූජා, ගණදෙවි පූජා, බහිරව පූජා

**ශාන්ති කර්ම හා යාතු කර්මවල ලක්ෂණ**
■ නර්තනය, රංගනය, වාදනය විවිධ කථන ස්වරූප හා විවිධ සැරසිලි ක්‍රම භාවිතා කෙරේ.
■ සංවාද යොදා ගනිමින් ද්විමාර්ගික සන්නිවේදනයක් සිදු කරයි. (ප්‍රේක්ෂකයන් සමග කතා කිරීම)
■ සරල හා හාස්‍යෝත්පාදක ස්වරූයක් ගැනීම.
■අදෘශාමාන බලවේග සමග අදහස් හුවමාරු කර ගැනීම.

## ගැමි නාටක
කිසියම් කතා පුවතක් හෝ කතා පුවත් කිහිපයකින් සැදුම් ලද්දා වූ කාලාංගයකි.
උදාඃ කෝලම්, සොකරි, රූකඩ

**සොකරි( උඩරට)**
පත්තිනිදේවිය මුල්කරගෙන පවත්වයි. හවබෝග විනාශවීමට අදාල ලෙඩරෝග වසංගත හා පළිබෝධ හානි ආදියෙන් සිදුවන විනාශයන් ගෙන් ආරක්ෂාව ලබා ගැනීමට හා මිනිසුන්ට වැලදෙන ව්‍යාධි වසංගත අපල උපද්‍රව වලින් ආරක්ෂාවීමට විවේකය විනෝදයෙන් ගත කිරීමට පවත්වයි.
ගොයම් කපා පාගා අවසන්වූ විට කමත රංග භූමිය කොටගෙන පවත්වයි.
.

**කෝලම් ( පහත රට)**
මෙහි ලීයෙන් සාදා පාට කරන ලද වෙස් මුහුණු පළඳින බැවින් වෙස් මුහුණු නාටක ලෙස හඳුන්වයි.

කෝලම් යන්න දෙමළ වචනයකි. ( නළුවෙකු විසින් පළඳින ලද වේශය යන අරුතගෙන දෙයි).

ගර්භණී මව්වරුන් වෙනුවෙන් පවත්වන අභිචාර ක්‍රමයක් ලෙසත් සශ්‍රීකත්වය පරමාර්ථ කොට ගන්නක් ලෙසත් හඳුනා ගැනේ.

ගැමිනාටික වලදී කවි කීම හා හිටිවන සංවාද උප යෝගි කර ගනු ලබයි මෙහිදී සම්පූර්ණ නාටක වශයෙන් හැඳින්වෙන කතා රංග දැක්වීමක් සිදු කරයි.

- සඳාකිඳුරු කතාව
- ගොඨයිම්බර කතාව
- මනමේ කතාව නිදසුන්වේ.

**සාම්ප්‍රදායික මාධවල වැදගත්කම**

- දැනුම ඉගෙනුම් සම්පාදනය.
- උපදේශාත්මක සන්දේශ ජනනය කළ හැකිවීම.
- සංස්කෘතික අංග හුවමාරු කිරීමට හැකිවීම.
- භාව ප්‍රකාශය.
- අහිතකර සමාජ ප්‍රවණතා විවේචනය කිරීම.
- සංස්කෘතික අංග හුවමාරු කිරීමට හැකිවීම.
- භාව ප්‍රකාශය.
- අහිතකර සමාජ ප්‍රවණතා විවේචනය කිරීම.
- විනොදාස්වාදය සඳහා යොදාගත හැකිවීම.

**සාම්ප්‍රදායික මාධ්‍ය වලින් ඉටු කරගත හැකි සන්නිවේදන අරමුණු.**

- උපදෙස් සම්පාදනය.
- පෙළඹවීම
- විවේචනය
- ඡීත්තු ගැන්වීම
- විනොදාස්වාදය ලබා ගැනීම

4.2 **ජන මාධ්‍ය ප්‍රභේද හඳුනා ගැනීම.**

ජන සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා කාලය හා දුර අතර පණිවිඩ හුවමාරුකර ගැනීම සඳහා යොදා ගනු ලබන උපාංග ජන මාධ්‍යයයි. නූතන සමාජයේ පවතින ප්‍රධාන ජනමාධ්‍ය ලෙස පොත් සහරා පුවත්පත් ගුවන්විදුලිය හා රූපවාහිනිය හඳුනාගත හැකිය.

**ඩිෆ්ලුවර් හා ඩෙනිස්**
**ජනසන්නිවේදන අවබෝධය කෘතිය**

**ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයට අනුව.**
අඥාශාංමාන ව වෙසෙන පිරිසකට කිසියම් මාධායකින් අමතන්නේනම් එය ජනමාධ්‍ය වේ.



**නව මාධ්‍ය**
නව මාධ්‍ය යනු අංකින තාක්ෂණය ඔස්සේ තොරතුරු අංකිත කිරීම ශබ්දය වචන දත්ත ග්‍රැෆික්ස් චිත්‍ර රූප වීඩියෝ හකුළුවා ඒවා ඉතා පහසුවෙන් පිටපත් කර අඩු පිරිවැයක් යටතේ ඉතා වේගයෙන් බෙදා හැරිය හැකි මාධ්‍ය වේ මෙම දත්ත බින්දුවත් එකත් අතර අංකිත ක්‍රමවේදයන්ට අනුව හකුළුවා දැක්විය හැකිය

නව මාධ්‍ය යන්නෙන් සරලව හැඳින්වුවහොත් දුරකථනය හා අන්තර්ජාලය ඕස්සේ සිදුවන සන්නිවේදනයයි
1960 දශකයේ පරිගණකය ආශ්‍රයන් විද්‍යාව සම්බන්ධ තොරතුරු සංස්කරණය හා යුද්ධ හමුදා ක්ෂේත්‍රවලට අවශ්‍ය තොරතුරු හුවමාරු කර ගැනීමට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් නව මාධා බිහිවිය

ටිම් බර්නර්ස් ලී විසින් ලෝක ව්‍යාප්ත ජාලය පිළිබඳ අදහස ඉදිරිපත් කිරීමත් සමග නව මාධ්‍යයේ වර්ධනය වේගවත් විය

විවිධ මාධා සම්පවීම සහ එක්වීම එනම් මාධ්‍ය
අභිසාරිතාව නව මාධ්‍ය ව්‍යාප්තවීම කෙරෙහි බලපා ලද ප්‍රබල සාධකයකි
මෙය නව සන්නිවේදන තාක්ෂණ වර්ධනයේ ප්‍රතිඵලයකි

**නව මාධ්‍යයේ ලක්ෂණ**

- අංකිතකරණය
- ජාලගතකරණය
- අන්තර්ක්‍රියාකාරිත්වය
- අධිපාඨනීයත්වය
- ස්වයංකරණය
- දත්ත සංචිතකරණය
- වේගවත් සන්දේශකරණය

නව මාධ්‍ය භාවිතයේ දී සංස්කෘතික ව්‍යුහ හා අවකාශය ජයගත හැකිය
නුතන මාධ්‍යවල දක්නට ලැබෙන තොරතුරුකරණයේ වේගයට වඩා වැඩි වේගයකින් මෙමගින් තොරතුරු හුවමාරු කිරීමට හැකිවී ඇත මෙහිදී ලොව පුරා මිනිසුන් අතර දුරස්ථ භාවය අවම කරීම හෝ සමීප කිරීම සිදුවේ

**සමාජ මාධ්‍ය**
සමාජ මාධ්‍ය යනු නව මෘධ්‍යාවල දියුණු අවස්ථාවකි එසේම නව මාධ්‍ය වලින් පැනනැගුණකි දුරකථනය හා අන්තර්ජාලය මෙහි ප්‍රභව අංගවේ මෙහි විශේෂත්වය වන්නේ නිර්මාණය කිරීම අන්තර්ගතය හුවමාරු කර ගැනීම හා සහභාගිත්වයයි

**රූපවාහිනිය**
ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වූ රූපවාහිනිය ලොවට හඳුන්වා දීම 1926 දී ජෝන් ලොගී බිලොයාර්ඩ් විසින් සිදු කළේය
මෙය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වශයෙන් හැඳින්විය හැකිය එමෙන්ම ලොව ප්‍රථම රූපවාහිනී සම්ප්‍රේෂණය 1936 දී ප්‍රථම වරට සිදුවිය 1979 වන විට ශ්‍රී ලංකාවේ රූපවාහිනිය ව්‍යාප්තවීම ආරම්භ විය

රූපවාහිනිය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි
ශ්‍රව්‍ය සංකලනය හේතුවෙන් ජනප්‍රිය මාධ්‍යයක් වීමට හා පුද්ගල මතය කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාවක් පවතී

ලොවපුරා සමාජ ආර්ථික දේශපාලනික සංස්කෘතික ප්‍රවණතා නිර්මාණය කිරීමෙහිලා මෙම මාධ්‍ය බලපා තිබේ අධ්‍යාපනික මාධ්‍යයක් ලෙස ආරම්භවන රූපවාහිනිය නිසා ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජ බිහිවීමට හේතු වී තිබේ

**අධ්‍යාපනය තොරතුරු සම්පාදනය විනෝදාස්වාදය හා පෙළඹවීම යන කාර්යය රූපවාහිනිය මගින් සිදුවේ**

**රූපවාහිනී මාධ්‍යයේ මූලික ලක්ෂණ**
■ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයකි
■ විවිධාකාර අන්තර්ගතයන්ගෙන් හා විචිත්‍රවත් ආකෘති වලින් සමන්විත වේ
■ පෞද්ගලික ගෘහස්ත සම්පතාවයකින් යුක්තය
■ ආකර්ශණීය මාධ්‍යයකි
■ පුද්ගලයාගේ පූර්ණ අවධානය ග්‍රහණය කර ගන්නා මාධ්‍යයකි
■ සංකීර්ණ තාක්ෂණයක් සහිතය
■ විධිමත් ආයතනික සංවිධාන ව්‍යුහයකින් සමන්විතය
■ ජාතික ජාත්‍යන්තර ලක්ෂණ වලින් යුක්තය

**සිනමාව**
සිනමාව යනු ශ්‍රව්‍ය දෘශ්‍ය හා ප්‍රක්ෂේපණ මාධ්‍යයකි රූපයක් චලනය කරමින් යමක් ප්‍රකාශ කිරීමට ගත් සාර්ථක උත්සාහයක් ලෙසට සිනමාව හැඳින්විය හැකිය

1865 දී ජූලියස් මරේ නැමැත් තෙකු විසින් කැමරා තුවක්කුව නිපදවීමත් සමගම සිනමාව ආරම්භවීම සඳහා මුල්ම අඩිතාලම වැටුණි 1891 තෝමස් අල්වා එඩිසන් විසින් නිකටෙස්කෝප් යන්ත්‍රය නිපදවීයි මෙය සිනමාවේ ප්‍රාථමික යුගයයි

## චිත්‍රපට වර්ග

**වික්‍රමාන්විත චිත්‍රපට**
**ක්‍රියාකාරී චිත්‍රපට**
**චරිතාපදාන චිත්‍රපට**
**කාටූන් චිත්‍රපට**
**වාර්තා චිත්‍රපට**



ජනමාධ්‍ය ලෙස අර්ථකථනය කරනනේ පුළුල් ප්‍රදේශයක විසිරී පවතින බහුවිධ අදෘශ්‍ය ග්‍රාහක කොට්ඨාසයකට ආමන්ත්‍රණය කරනු ලබන මාධ්‍ය වේ.
**ජනමාධ්‍ය බිහිවීමට ප්‍රධාන සාධකය වන්නේ සන්නිවේදන තාක්ෂණයේ වර්ධනයයි.**

1922 **ජෝන්රිත් සාමිවරයා** යුධ තොරතුරු ලබා දීමට භාවිතා කළ මාධ්‍ය ජනයා වෙනුවන් භාවිත කරන ලෙස ප්‍රථම වරට ප්‍රකාශ කරන ලදී.

## ජනමාධ්‍ය

මුද්‍රිත මාධ්‍ය - පුවත්පත්, ග්‍රන්ථ, සඟරා
විද්‍යුත් මාධ්‍ය - ගුවන්විදුලිය, රූපවාහිනිය

**ජනමාධ්‍යයේ විශේෂතා**
■ තාක්ෂණික මෙවලම් භාවිතය.
■ ක්ෂණික හා ඛණ්ඩතාවයකින් යුක්තවීම.
■ සංවිධානගත ආයතනික ව්‍යුහය.
■ වෘත්තීය සනනිවේදකයෝ සිටීම.
■ බහුවිධ දොරටු පාලක ක්‍රියාවලියකට යටත්වීම.
■ බහුවිධ ග්‍රාහකතන්වයකින් යුක්තවීම.
■ ප්‍රමාදිත ප්‍රතිපෝෂණයක් දක්නට ලැබීම.
■ බොහෝ විට වාණිජත්වය පදනම් කර ගැනීම.

**ජනමාධ්‍යයේ සාම්ප්‍රදායික කාර්යයන්**
■ අධ්‍යාපනය ලබාදීම.
■ තොරතුරු සම්පාදනය.
■ පෙළඹවීම
■ විනොදාස්වාදය

**ජනමාධ්‍යට විශේෂිත වූ කාර්යයන්**
■ සුපරීක්ෂණය
■ අර්ථකථනය
■ සහසම්බන්ධය
■ සමාජානුයෝජනය

**හැරල්ඩ් ඩී ලැස්වෙල් දක්වන ජනමාධ්‍යයේ කාර්යයන්.**
■ සුපරීක්ෂණය.
■ ප්‍රවෘත්ති ලොවපුරා බෙදා හැරීම.
■ ප්‍රේක්ෂක මනය හා අදහස් හැඩගැස්වීමේ හැකියාව.

**මහාචාර්ය විල්බර් ශ්‍රාම් දක්වන ජනමාධ්‍යයේ කාර්යයන්**
■ ආරක්ෂකයකුගේ භූමිකාව
■ගුරුවරයකුගේ භූමිකාව
■ සාකච්ඡා මණ්ඩපයක භූමිකාව

**පොදු කාර්යයන්**
■ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මුර සෙබළකුගේ භූමිකාව.
■ සමකාලීන සමාජ විඥානය හඳුනා ගැනීමට උපකාරීවීම.
■ ග්‍රාහක රසඥතාව පුළුල් කිරීමට සහයවීම.
■ නවෝත්පාදන විසරණය සඳහා තොරතුරු
■ කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

## ජනමාධ්‍ය වර්ගීකරණය

**පුවත්පත**

පුවත්පත මුල්ම සංවිධිත ජනමාධායයි

පුවත්පත යනු ප්‍රවෘත්ති ප්‍රසිද්ධ කරන පත්‍රයයි.

**සුමංගල ශබ්දකෝෂය**

මහජනයා උනන්දුවක් දක්වන ප්‍රවෘත්ති වෙළඳ දැන්වීම් සාහිත්‍ය හා සම්බන්ධ කරුණු හා අනෙකුත් අංශ ඇතුළත් ව දිනපතා හෝ සතිපතා පළ කර මුද්‍රිත ප්‍රකාශය පුවත්පතයි.

**ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය**

**පුවත්පතක ලක්ෂණ**

■ මුද්‍රිත ප්‍රකෘශනයක් වීම.
■ එකට ගොණු වූ කටුගසා අමුණා නැති කඩදාසි ගොණුව ක් වීම.
■ දිනපතා හෝ සතිපතා ප්‍රකාශනයට පත්වීම.
■ පොදු රුචිකත්වයක් පැවැත්ම.
■ එක් විශේෂිත භූගෝලීය කලාපයකට සීමාවීම.

## පොත් ග්‍රන්ථ

ලියු හෝ මුද්‍රිත ග්‍රන්ථය

**සුමංගල ශබ්ද කෝෂය**

ලියු හෝ මුද්‍රිත හෝ අමුද්‍රිත හෝ කොළ එකට එක් කොට තනාගත් ලේඛන මිටිය පොතයි.

**මහා සිංහල ශබ්ද කෝෂය**

**පොත්වල ලක්ෂණ**

■ ලෝකයේ මුල්ම මාධ්‍ය වීම.
■ ජීව කාලය ඉතා වැඩියි.
■ අතීත සමාජ පරිවර්තනයන්ට විශල දායකත්වයක් ලබා දී ඇත.
■ දේශපාලන හා ආගමික පත්‍රිකා මධ්‍යතන යුගයේ චින්තනය වෙනස් කිරීමට හේතු වූ පත්‍රිකා විශේෂයකි.
■ නීතිරීති අණපනත් සහ රජයට සම්බන්ධ විවිධ ලේඛන පොත් බවට පත්වීම.

## සඟරා / වාර ප්‍රකාශන

යම් ක්ෂේත්‍රයක් අරමුණු කර ගෙන හෙෝ යම් පාඨක පිරිසක් ඉලක්ක කර ගෙන නිශ්චිත කාල සීමා වලදී පළ වන කෙටි ලිපි හා රූප සටහන් සහිත ප්‍රකාශනය-කි වාර ප්‍රකාශන නමින් ද මෙය හැඳින්වේ සගරා පළ කිරීම මාසික ද්වි මාසික අර්ධ වාර්ෂික හා වාර්ෂික ව සිදුවේ

සතිපතා හෝ මාසිකව ලිපි ලේඛන හෝ ඡායාරූප ඇතුළත් තනි ලේඛනයකි

**ඔක්සෆර්ඩ් ශබ්ද කෝෂය**

එදිනෙදා ජීවිතයට අවශ්‍ය තොරතුරු සහිත යම් නිශ්චිත වකවානුවක අඛණ්ඩව ප්‍රකාශයට පත්කරන එක බඳින ලද ප්‍රකාශනයකි

**යුනෙස්කෝ සංවිධානය**



**සඟරාවල ලක්ෂණ**

■ නිශ්චිත තේමාවක් ඔස්සේ පළ කිරීම (කලා/ආගමික)
■ බොහෝ විට දෛනික තොරතුරු අන්තර්ගත නොවීම
■ ආකර්ශනීය නිර්මාණශීලි මුහුණුවරක් ගැනීම ( භාෂාව/ ඡායාරූප)

## ගුවන්විදුලිය

ගුග්ලිමෝ මාකෝනි විසින් ගුවන්විදුලිය හඳුන්වා දුන්නේය හඬ සම්ප්‍රේෂණය කරන මාධායයකි අධි සං-ඛ්‍යාත ප්‍රත්‍යාවර්තක ධාර අනුසාරයෙන් ජනිත කරවන චුම්භක තරංග උපයෝගී කර ගනිමින් සම්බන්ධින කරන රැහැන් රහිතව එක් තැනක සිට හඬ විසුරුවා හැරෙන මාධ්‍යයකි

දුරකථනය හා ටෙලිග්‍රාෆ් තාක්ෂණයේ වර්ධනය වීමේ ප්‍රතිපළයක් ලෙස බිහි විය 1914* 1915 ගුවන්විදුලි ප්‍රචාරය විධිමත් ලෙස ආරම්භ විය
ප්‍රථම ලෝක සංග්‍රාම සමයේ දී හමුදා කටයුතු සඳහා භාවිත වී පසුකාලීනව ගෘහස්ථ උපකරණයක් බවට පත්විය
ගුවන්විදුලිය ශ්‍රව්‍ය මාධ්‍යයකි
හඬ ආත්මය කොට ගත් මාධ්‍යයකි

**ගුවන්විදුලියේ හඬ කොටස් තුනකි**

මිනිස් හඬ
සංගීතය
බාහිර ශබ්ද

**ගුවන්විදුලියේ ලක්ෂණ**

■ ක්ෂණික බව
■ පුළුල් ආවරණ කලාපයකින් යුක්තවීම
■ එක් දිශාවකට සන්දේශ ගමන් කරයි
■ සරල ජංගමශීලි මාධ්‍යයක් වීම
■ එක් වරක දී තේරුගත හැකි වචන ලෙස සන්දේශ ඉදිරිපත් කිරීම
■ එක් එක් ග්‍රාහක කොටස් ඉල්ක්ක කර ගනිමන් වැඩස-ටහන් ඉදිරිපත් කළ හැකිය
■ අන්තර්ජාතිකජාතික ප්‍රාදේශීය වශයෙන් ගුවන් විදුලි සේවා පැවත්ම
■ රූපවාහිනියට සාපේක්ෂ අඩු වියදම් සහිත මාධ-යයකි